නව නිපයුම්

# නව වී වර්ගයක් බිහිවේවි

කලුතර දිස්ත්‍රික්කයයේ ඉතා ජනප්‍රිය වී වර්ගය හේරත් බණ්ඩා යන නමින් හැඳින්වේ. අඩු අස්වනු ගෙන දෙන හේරත් බණ්ඩා වී වර්ගයේ ජනප්‍රිය ලක්ෂණ සහිතව එහෙත් වැඩි අස්වනු ගෙනදීමේ සහජ හැකියාවක් ඇති වී වර්ගයක් බිහි කිරීමේ ප්‍රයත්නයේ සාර්ථක ප්‍රතිඵලයක් ලෙස බී. ඩබ්ලිව්. 272–6 බී ප්‍රභේදය හැඳින්විය හැක.

මෙම නව වී වර්ගයේ ගුණාංග කීපයක් මෙසේය.

1. වැඩි අස්වනු ගෙන දීමේ හැකියාව (හෙක්: 1 ට ටොන් 4.6 ට වැඩි) ගොවීන්ගේ කුඹුරුවල හෙක්ටයාර් 1 ට ටොන් 2.6 සාමාන්‍ය අස්වැන්නක් ලැබුණු අතර හේරත් බණ්ඩා ප්‍රදේශයේ සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාර් 1 ට ටොන් 1.3 පමණ විය.
2. ඇද වැටීමට ඔරොත්තු දෙයි.
3. කොළපාලු රෝගයට ඔරොත්තු දෙයි.
4. ලවණ පසට මධ්‍ය වශයෙන් ඔරොත්තු දෙයි.
5. සහල් පෝෂණමය වටිනාකමින් උසස්ය. (මාංශ ජනක ධාතු ප්‍රතිශතය 10 සිට 12.7 දක්වාය.)

මෙම වී වර්ගය හැල් කුඹුරුවල සහ අර්ධ හැල් කුඹුරුවලද සාර්ථක අස්වනු ලැබීම සඳහා වගා කළ හැක.